# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් පාඨමාලා සඳහා 2026.01.27 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

i. **බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව**
ii. **බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

**පාඨමාලාවේ ස්වරූපය**

බෞද්ධ මනෝවිද්‍යාව, බෞද්ධ උපදේශනය හා මනෝචිකිත්සාව පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවකින් යුක්තව මෙම පාඨමාලාව සැලසුම්කොට ඇත. නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බෞද්ධ උපදේශනය සඳහා ඉහළ පිළිගැනීමක් හිමිව තිබේ. ස්වකීය ජීවිතය කළමනාකරණය කර ගැනීමට මෙන්ම උපකාරක සේවාවක් ලෙස උපදේශන සේවාවේ යෙදී සිටින හා එයට පිවිසීමට කැමති ඕනෑම අයෙකුගේ වෘත්තීය කුසලතා සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම මෙම පාඨමාලා තුළින් ලබාදීමට අපේක්ෂිතය. මනෝඋපදේශකයින්, විද්‍යාර්ථීන්, අධ්‍යාපන, සෞඛ්‍ය, නීති, මානව සම්පත් කළමනාකරණය ආශ්‍රිත වෘත්තීයවේදීන්ට හා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන්ට මෙන්ම බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ හරවත් ශාස්ත්‍රීය හැදෑරීමකට කැමති ඕනෑම කෙනෙකුට ගැළපෙන පරිදි සැකසූ සති අන්ත පාඨමාලාවක් ලෙස මෙම පාඨමාලා හඳුන්වා දී ඇත.

**ඇතුළත්වීමේ සුදුසුකම්:**

**01 බෞද්ධ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව:**

- අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම හෝ
- ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත්වීම හෝ
- බෞද්ධ ධර්මාචාර්ය විභාගය / දහම් පාසල් අවසාන විභාගය සමත්වීම හෝ
- උපදේශන සේවාවේ නියුතු රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක වසර 2ක පළපුරුද්දක් සහිත අයෙකු වීම හෝ
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

## 02 බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම හෝ
- අ.පො.ස (උසස් පෙළ)විභාගය සමත්වී තිබීම හෝ
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් පිරිනමන බෞද්ධ උපදේශන ඩිප්ලෝමාව සමත් ව තිබීම

හෝ

- කවර හෝ විශ්වවිද්‍යාලයකින් පිරිනමන බෞද්ධ උපදේශනය /මනෝවිද්‍යා ඩිප්ලෝමාවක් සමත් ව තිබීම හෝ
- පිළිගත් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන මනෝවිද්‍යාව උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් ව තිබීම හෝ
- දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පරීක්ෂණ සමත්ව තිබීම හෝ
- බුද්ධධර්ම උසස් ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් වීම හෝ
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

**පාඨමාලා කාලයඃ**

බෞද්ධ උපදේශන ඩිප්ලෝමා /උසස් ඩිප්ලෝමා පාඨමාලාවඃ අවුරුදු 01

**මාධ්‍යය - සිංහල**

**පාඨමාලා ගාස්තුඃ**

බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව : රු. 40,000/-

බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාවඃ රු. 45,000/-

**(මෙම ගාස්තු වාරික දෙකකින් / තුනකින් ගෙවිය හැකි ය).**

**වැඩිදුර තොරතුරු විමසීම්**

**කාර්යාලය : 011-2580609 /011-2502944 පාඨමාලා සමායෝජක : 0718390050 /**

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරයඃ**

අයදුම්පත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට පිවිස www.bpu.ac.lk බාගත කළ හැකි ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.500/- ක මුදලක් ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ අයදුම්පත භාරදිය යුතුය.

තැපැල් මගින් අයදුම්පත් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9”x4” ප්‍රමාණයේ රු. 110/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට 2026.01.20 දිනට පෙර එවීමෙන් ලබා ගත හැකිය.

**චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **තමන් හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාවේ නම සඳහන් කර “පාඨමාලාව සඳහා අයදුම්පත්‍ර “යනුවෙන්** සඳහන් කළ යුතු ය.

**සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේ දී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ තම නම ඉදිරියෙන් තමන් හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාවේ සංකේත අංකය සඳහන් කර ඒ යටතේ ගෙවීම කළ යුතුය.**

★ **බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා / බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලා - BC/Dip**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.01.27 දිනට හෝ එදිනට පෙර එවිය යුතුය.

සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,කොළඹ 07.

**අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ලේඛකාධිකාරී**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**
2025.11.28